සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ,
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**<u>අධිකරණ රෙජිස්ට්‍රාර් II ශ්‍රේණිය I පන්තියෙන් අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියට</u>**
**<u>උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම - 2024 .</u>**

අංක 2088/26 සහ 2018.09.11 දිනැති උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 8.17.1 ඡේදය යටතේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද අධිකරණ රෙජිස්ට්‍රාර් II ශ්‍රේණිය I පන්තියේ නිලධරයන්ගෙන් අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍ර කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. සේවා ව්‍යවස්ථාවේ 8.17.1 හි සඳහන් සුදුසුකම්

i. අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණිය I පන්තියේ වසර 03 කට නොඅඩු සක්‍රිය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ එම කාලයට අදාල සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

ii. අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණිය I පන්තියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී තිබීම.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව සහ අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 396 අනුව අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම

හෝ

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුකූලව නිකුත් කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 456 අනුව අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම

03. **<u>2023.08.03 දිනට උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 8.17.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන්</u>** එකී ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඇමුණුම 03' හි සඳහන් ආකෘතියට අනුව ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත්‍ර **2024 ජුනි මස 28** වැනි දින හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ 'ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ I ශ්‍රේණියට උසස් කිරීම' යන්න සඳහන් කළ යුතුය.

04. කුමන හේතුවක් නිසාවත් මෙම කාර්යාලයට එවන අනෙකුත් ලේඛන සමඟ අයදුම්පත් නොඑවිය යුතු අතර අයදුම්පත් සමඟ ඊට අදාළ සුදුසුකම් සනාථ කරන සහතික හැර වෙනත් ලිපි ලේඛන අමුණා එවීම නොකළ යුතුය. මෙම උපදෙස් නොසලකා එවනු ලබන අයදුම්පත් හා ලිපි ලේඛන සම්බන්ධයෙන් වග කියනු නොලැබේ. නියමිත දිනට පසුව එවන අයදුම්පත් සහ නිසි අයුරින් සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. මෙම ලිපිය ඔබ අධිකරණයේ අධිකරණ රෙජිස්ට්‍රාර් II ශ්‍රේණිය I පන්තියේ නිලධාරීන්ට දැන ගැනීමට සලස්වන්න.

එච්.එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2024 ජුනි මස 06 වන දින,
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

**එච්. සංජීව සෝමරත්න**
**ලේකම්**
**අධිකරණ සේවා කොමිෂන් සභාව**
**කොළඹ 12**